සී/ස සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගම -2017/2018

---

සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගමේ ("සමාගම") 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ('මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගනණය සිදු කරන ලදී ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමානාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ලබාගැනීම පිණිස විගනණය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගනකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම් කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සටහන් අංක 2.2.1.2 අනුව පොලී ආදායම මුදල් පදනම මත හඳුනාගන්නා ලද බව සඳහන් විය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන වල පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන තිබුණි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් වල 10. 21 වගන්තියට පටහැනිව පසුගිය වසරට අදාළ පාරිතෝෂික දීමනාව රු. 4,569,340 ක් සහ 2015/2016 මුදල් වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 221, 918 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගලපා තිබුණි එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් සහ අලාභය රු. 4,569,340 ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු. 221,918 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඇ) සේවකයින්ගේ සේවය කළ වර්ෂ ගණන වැටයීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිකය සඳහා වූ ප්‍රතිපාදනය රු. 1,734,017 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) උපලේඛන, ඉන්වොයිසි සහ ලදුපත් නොමැතිවීම හේතුවෙන් රු. 26,123,934 ක් වූ ජංගම වගකීම් විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ ත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ:

- තත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත්ය.

### 2.3 සමාගම පිහිටුවීම

සමාගම පිහිටුවීම සම්බන්ධයෙන් වූ කැබිනට් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 9.2 (ඇ) වගන්තියට පටහැනිව, අනුමත සේවක සංඛ්‍යාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.

### 2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

2018 මාර්තු 31 වන දිනට එකතුව රු. 4,919,594 ක් වූ ලැබිය යුතු හිඟ ශේෂයක් වසර 5 ක් මුළුල්ලේ අයකර ගෙන නොතිබුණි

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් ලද ප්‍රතිඵලය රු. 5,613, 608 ක බදු පසු ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු. 4,981,312 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,594,920 ක පිරිහීමක් පෙන්නුම් කරන ලදී. සමස්ත ආදායම රු. 39,245,934 කින් වැඩිවීමට එරෙහිව සමස්ත වියදම රු50,011,394 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

**4.** ගිණුම් කටයුතු භාවය සහ යහ යහපාලනය

-----------------------------------------

**4.1** අභ්‍යන්තර විගණනය

--------------------

**2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ් 2009 (1) දරන කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණි.**